# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1850/33 - 2014 පෙබරවාරි මස 19 වැනි බදාදා - 2014.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

11 වැනි වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මා විසින්, ඉහත කී පනතේ 9 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ සහ 2014 පෙබරවාරි මස 03 වැනි දින අංක 1848/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් "අධිවේගී මහා මාර්ගයක්" බවට ප්‍රකාශයට පත් කරන ලද පිටත වටරවුම් ජාතික මහා මාර්ගයේ කොට්ටාව - කොතලාවල කොටසේ මේ නියමයේ උපලේඛනයේ දක්වා ඇති කොටස "ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් " විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සමන්විත වන ප්‍රදේශය***

පිටත වටරවුම් ජාතික මහා මාර්ගයේ කොට්ටාව - කොතලාවල කොටස ලෙස නම් කර ඇති අධිවේගී මහා මාර්ගයේ කොට්ටාව (කි. මී. 0.000) සහ කොතලාවල (කි. මී. 9.900) අතර පිහිටා ඇති කිලෝ මීටර් 9.900 ක් දිගින් සහ මීටර් 40.00 - 60.00 ක් පළලින් යුතුව විහිදෙන මාර්ගයේ කොටස වේ.

03 - 130


1A - PG 1980— 660 (2014/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

11 වැනි වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මා විසින්, ඉහත කී පනතේ 9 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ සහ 2014 පෙබරවාරි මස 03 වැනි දින අංක 1848/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් "අධිවේගී මහා මාර්ගයක්" බවට ප්‍රකාශයට පත් කරන ලද ගාල්ල - මාතර ජාතික මහා මාර්ගයේ මේ නියමයේ උපලේඛනයේ දක්වා ඇති කොටස "ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක්" විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සමන්විත වන ප්‍රදේශය***

ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය ලෙස නම් කර ඇති අධිවේගී මහා මාර්ගයේ පින්නදූව (කි. මී. 95.275) සහ ගොඩගම (කි. මී. 124.800) අතර පිහිටා ඇති කිලෝ මීටර් 29.525 ක් දිගින් සහ මීටර් 84.00 ක් පළලින් යුතුව විහිදෙන මාර්ගයේ කොටස වේ.

03 - 131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.